# සිංහල

# කියවීම් පොත

# 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
**www.nie.ac.lk**

මුද්‍රණය හා බෙදා හැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල - 1 ශ්‍රේණිය

කියවීම් පොත

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

ISBN - 978-624-5729-80-7

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය: www.nie.ac.lk
විද්‍යුත් තැපැල: info@nie.edu.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මල්වාන, කලුකොඳයාව, නො. 44/D හි පිහිටි ප්‍රින්ටේජ් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා බෙදා හරින ලදි.

Publication by : National Institute of Education

Printed by : Printage (pvt) Limited
No. 44/D, Kalukondayawa, Malwana..

**උපදේශකත්වය**
මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය දර්ශන සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය**
ආර්. එම්. කුමුදුමලී ද සිල්වා
අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**විෂයමාලා කමිටුව**
නිර්මලා ජයසිංහ
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බාහිර සම්පත් දායකත්වය**
මහාචාර්ය ස්වර්ණා ඉහළගම
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ධම්මිකා රටියල
(විශ්‍රාමික ගුරු)

**භාෂා සංස්කරණය**
එච්. පී. සුසිල් සිරිසේන
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය

ඩබ්ලිව්. කරුණාරත්න
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධනය මධ්‍යස්ථානය, ගිරාගම

**පිට කවරය හා චිත්‍ර නිර්මාණය**
සමන් කලුබෝවිල
කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම**
ඒ. ඩී. අනුෂා තරංගනී
පරිගණක ග්‍රැෆික් නිර්මාණකරු, ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

පළමුවන ශ්‍රේණියට නිර්දිෂ්ට මෙම 'කියවීම් පොත' ඔබ අතට පත් කරනුයේ ඉමහත් සතුටිනි.

මෙම පොත හොඳින් පරිශීලනය කර කියවීමේ ප්‍රවීණතාව සහ අවබෝධය වර්ධනය කර ගනු ඇතැයි අපේක්ෂා කරමි.


'ඡේද, කතන්දර හා දෙබස් ශබ්ද නගා නිවැරදි ව කියවීමේ' ඉගෙනුම් පලය සාධනය කරනු වස් මෙම පොතෙහි අනුක්‍රමයෙන් ගොඩනැගෙන පාඩම්, ඔබට මනා උපකාරයක් වනු ඇත.

මෙම පොත හොඳින් කියවා එහි ඇති අදහස් ද තම ජීවිතයට එක් කර ගනිමින් යහපත් පුරවැසියෙකු වීමට අවශ්‍ය අඩිතාලම සපයා ගැනීම අප සැමගේ ම බලාපොරොත්තුවයි.

**නිර්මලා ජයසිංහ**
ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පටුන


| පාඩම | පිටු අංක |
| --- | --- |
| වචන උගනිමු | 1 - 5 |
| මල් | 6 - 8 |
| හාවා සහ යහළුවෝ | 9 - 10 |
| හාවාගේ වග | 11 - 12 |
| උපන් දිනය | 13 - 17 |
| සතුන්ට ආදරෙයි | 18 - 20 |
| කුරුළු ලැල්ල | 21 - 23 |
| අහස | 24 - 25 |
| සඳරුයි සමනලයයි | 26 - 28 |



ගස



ගඟ



මල




ගඟ ළඟ ගස


ගස යට මල

ගගන නයන
අර බලන්න.






ගස වට කර මල්
ඉහළ පහළ  මල්



# මල්

පාට පාට මල්
හරි ලස්සන මල්
සරලා මල් බලන්න ආවා.
සාරදාත් ආවා.




අර බලන්න සාරදා
ලස්සන සමනලයෙක්
සරලා කිවුවා.

සමනලයා මල උඩ
මලක් උඩ තවත් මලක්
සාරදා කිවුවා.

මහ පුදුමෙකි
මලෙක මලෙකි
නැහැ එහි සකි
සමනලයෙකි

කුමාරතුංග මුනිදාස මහතා



# හාවා සහ යහළුවෝ

හාවා අඹ ගස යටට ආවා.


ගගන හාවා දැක්කා.
සරලා එන්න.
කලණ එන්න.
සාරදාත් එන්න.
හාවා බලන්න එන්න.



සරලා ආවා.
කලණිත් සාරදාත් ආවා.

අන්න හාවා
මම හාවා ළඟට යන්න ද?
කලණි ඇසුවා.

හාවා බය වෙයි
අපි ඈත ඉඳන් බලමු
ගගන කිවුවා.





# හාවාගේ වග

හා හා හරි හාවා
කැලේ මැදින් ආවා
හිට ගෙන ගඟ ගාවා
වට පිට ඇහැ ලෑවා

කොළ දෙකටක් කෑවා
පැන් උගුරක් බීවා
තොල කට ලෙව කෑවා
ඉතින් ඇතැයි කීවා



තබා නිකට ගාවා
වීණාවක් ගෑවා
මිහිරි සින්දු කීවා
නැටුම් ටිකක් පෑවා

එයින් වෙහෙස වූවා
ඉඳ ගෙන හති ලෑවා
තණ බිස්සේ බාවා
ඇඟ පත සැතැපූවා

කුමාරතුංග මුනිදාස මහතා

# උපන් දිනය

අද නයනගේ උපන් දිනයයි.

නයන උදෙන් ම අවදි වුණා.
දත් මැද්දා.
මුහුණ සේදුවා.



නයන සාලයට ආවා.
නයනගේ යහළුවොත් ආවා.
අම්මයි තාත්තයි අක්කයි සාලයට ආවා.



සුබ උපන් දිනයක් වේවා!
හැම දෙනා ම නයනට සුබ පැතුවා.
බොහොම ස්තුතියි
නයන කිවුවා.

හැම දෙනා ම කිරිබත් කෑවා.
තේ පානය කළා.



යහළුවන් රැගෙන ආ තෑගි නයනට දුන්නා.
ස්තුති කරමින් නයන තෑගි ගත්තා.

පුතේ, මේ රඹුටන් පැළය ඔයාට
මේක අපි වත්ත පහළ සිටවමු
තාත්තා කිවුවා.



මේ තමයි
අපි පුතාට දෙන උපන් දින තෑග්ග
අම්මා කිවුවා.

නයන රඹුටන් පැළය සිටවූවා.

මම මේ පැළය හොඳට රැක බලා ගන්නවා නයන කිවුවා.



උපන් දිනය දවසේ නයන ගොඩක් සතුටු වුණා.

# සතුන්ට ආදරෙයි

ගුරුතුමිය පන්තියට ආවා.
ආයුබෝවන්! ගුරුතුමී.
ආයුබෝවන්! දුවේ පුතේ.

මගේ පුංචි දුවලා පුතාලා
සතුන්ට ගොඩක් ආදරෙයි නේද?

ඔව් ගුරුතුමී,
අපි සතුන්ට ගොඩක් ආදරෙයි.



සතුන්ට ආදරයෙන් සලකන්නේ කොහොම ද?
ගුරුතුමී ඇසුවා.
සතුන්ට හිරිහැර කරන්න හොඳ නෑ
සතුන්ට කෑම බීම දෙන්න ඕනෑ
ගගන කිවුවා.
බොහොම හොඳයි ගගන
ගුරුතුමී කිවුවා.



සතුන්ට ආදරයෙන් සලකන
දුවලා පුතාලා අත් ඔසවන්න
ගුරුතුමී කිවුවා.


සියලු දෙනා ම අත් එසවූවා.
බොහොම හොඳයි.
හැමෝම සතුන්ට ආදරයෙන් සලකනවා.

එහෙනම් දැන් අපි ලස්සන කවියක්
ගායනා කරමු.



# කුරුලු ලෑල්ල

වත්ත පහළ අඹ ගහ ළඟ
හොඳට සෙවණ තිබෙන තැනක
කුරුලු ලෑල්ලක් කදිමට
හදලා ඇත අපේ ගෙදර




ලොකු මල්ලී එක දවසක
පොඩි මල්ලී තව දවසක
කුරුල්ලන්ට කෑම අරන්
එතනට යනවා හැම දින

පසුවදාට කුරුල්ලන්ට
බඩ පිරෙන්න කෑම දෙන්න
ලෑල්ල පිරිසිදු කරන්න
මම යනවා හැන්දෑවට



ලේනුන් සහ පොල්කිච්චන්
ගිරවුන් සහ දෙමලිච්චන්
පිළිහුඩුවන් සහ කපුටන්
කෑමට එනවා උදෙන් ම


ලේන් හාමි කෑම අරන්
එක පිම්මේ නගියි ගහට
දෙමලිච්චෝ කඩිමුඩියේ
පනිති වතුර බඳුන උඩට



සතුන් වුණත් එකමුතුවට
කෑම කන්නෙ අපූරුවට
බලා ඉන්න පුංචි අපට
සතුටක් දැනෙනවා හිතට

# අහස

අහස උසයි හරි ම උසයි
එහි තරුමල් පිපී දිලෙයි
උඩ පැනලා තරු කඩන්න
බැරි තරමට අහස උසයි



අත දික් කරලා කඩන්න
ඉණිමඟ තියලා කඩන්න
ගස් නැගලා තරු කඩන්න
බැරි තරමට අහස උසයි

හඳ පායා හරි ම හැඩයි
මුළු පරිසරය ම එළියයි
හඳත් අපිට අල්ලගන්න
බැරි තරමට අහස උසයි

සඳ තරු අහසේ තිබුණාට
අල්ලන්නට බැරි වුණාට
දුක දැනුණත් පුංචි සිතට
තරහක් නෑ කිසි දවසක

සඳයි තරුයි දෙස බලමින්
පුළුවනි සතුටක් ලබන්න
හැමදාමත් ඔය විදිහට
පායා අහසේ දිලෙන්න



# සඳරුයි සමනලයයි

සඳරු: සමනලයෝ... සමනලයෝ...
සුබ උදෑසනක් වේවා!

සමනලයා: සුබ උදෑසනක් වේවා! ඔබටත්
මල් පැණි බොන්නට ආවා උදයෙන්



සඳරු: උදෙන් ම දැක්කම මට හරි සතුටුයි
සතුන්ට මම නම් හරි ම ආදරෙයි


සමනලයා: සතුන්ට කිසිදා හිරිහැර නොකරන
දරුවෙකු බව මම දන්නවා ඔබ ගැන

සඳරු:  සැමදා උදයෙන් මම පිබිදෙනවා
පාඩම් කරලා මෙතැනට  එනවා

සමනලයා:
හොඳින් ඉගෙන ගෙන පාඩම්  කරලා
යහපත් දරුවෙක් වෙන්නකො  මතු දා



සඳරු:  කතා කළා අප හැම දින  හමු වී
කවියක් කියමු ද දෙදෙනා එක් වී



මේ මල් ගස්වල පිපී තිබෙන මල්
අමුණා සාදන මල් වැල් විලසින්
සැමදා එකමුතු වී අප සිටියොත්
ලෝකය ලස්සන වේයි හැමදාමත්

# කියවීම් පොතේ අන්තර්ගත වචන සහ එම වචන ඇතුළත් පිටු අංක


ගස (1, 3, 5, 9)
ගඟ (2, 3. 11)
මල (2, 3, 7)
ළඟ (3, 21)
යට (3, 9)
ගගන (4, 9, 10, 19)
නයන (4, 13, 14, 15, 17)
අර (4, 7)
බලන්න (4, 6, 7, 9)
වට (5, 11)
කර (5)
මල් (5, 6, 28)
ඉහළ (5)
පහළ (5, 16)
පාට (6)
හරි (6, 11, 26)
ලස්සන (6, 7, 20, 28)
සරලා (6, 7, 9, 10)
ආවා (6, 10, 11, 14, 18, 26)
සාරදාත් (6, 9)
සාරදා (7)
සමනලයෙක් (7)
කිවුවා (7, 10, 14, 16, 17, 19, 20)
සමනලයා (7, 26, 27)
උඩ (7)
මලක් (7)
තවත් (7)
මහ (8)
පුදුමෙකි (8)
මලෙක (8)
මලෙකි (8)
නැහැ (8)
එහි (8)
සකි (8)
සමනලයෙකි (8)
හාවා (9, 10, 11)
යහළුවෝ (9)
අඹ (9, 21)
දැක්කා (9)
එන්න (9)
කලණ (9, 10)
කලණත් (10)
අන්න (10)
මම (10, 17, 26, 27)
ළඟට (10)
යන්න ද (10)
ඇසුවා (10, 19)
බය (10)
වෙයි (10)
අපි (10, 16, 27)
ඈත (10)
ඉඳන් (10)
බලමු (10)
හාවාගේ (11)
වග (11)
හා (11)
කැලේ (11)
මැදින් (11)
හිට (11)
ගෙන (11)
ගාවා (11, 12)
වට (11)
පිට (11)
ඇහැ (11)
ලෑවා (11)
කොළ (11)
දෙකටක් (11)
කෑවා (11, 15)
පැන් (11)
උගුරක් (11)
බීවා (11)
තොල (11)
කට (11)
ලෙව (11)
ඉතින් (11)
ඇතැයි (11)
කීවා (11)
තබා (12)
නිකට (12)
වීණාවක් (12)
ගෑවා (12)
මිහිරි (12)
සින්දු (12)
නැටුම් (12)
ටිකක් (12)
පෑවා (12)
එයින් (12)
වෙහෙස (12)
වූවා (12)
ඉඳ (12)
හති (12)
තණ (12)
බිස්සේ (12)
බාවා (12)
ඇඟපත (12)
සැතපූවා (12)
උපන් (13, 16, 17)
දිනය (13, 17)
අද (13)
නයනගේ (13)
උදෙන් ම (13, 22)
අවදි (13)
වුණා (13, 17)
දත් (13)
මැද්දා (13)
මුහුණ (13)
සේදුවා (13)
සාලයට (14)
යහළුවොත් (14)
අම්මයි (14)
තාත්තයි (14)
අක්කයි (14)
සුබ (14)
දිනයක් (14)
වේවා (14, 26)
හැම දෙනා ම (14, 15)
නයනට (14, 15)
පැතුවා (14)
බොහොම (14, 19)
ස්තුතියි (14)
කිරිබත් (15)
තේ (15)
පානය (15)
කළා (15, 27)
යහළුවන් (15)
රැගෙන (15)
ආ (15)
තෑගි (15)
දුන්නා (15)
ස්තුති (15)
කරමින් (15)
ගත්තා (15)
පුතේ (16, 18)
මේ (16, 17)
රඹුටන් (16, 17)
පැළය (16, 17)
ඔයාට (16)
මේක (16)
වත්ත (16, 21)
සිටවමු (16)
තාත්තා (16)
තමයි (16)
පුතාට (16)
දෙන (16)
තෑග්ග (16)
අම්මා (16)
සිටවූවා (17)
හොඳට (17)
රැක (17)
බලා (17)
ගන්නවා (17)
දවසේ (17)
ගොඩක් (17)
සතුටු (17)
සතුන්ට (18, 19, 20, 26)
ආදරෙයි (18)
ගුරුතුමිය (18)
පන්තියට (18)
ආයුබෝවන් (18)
ගුරුතුමී (18, 19, 20)
දුවේ (18)
මගේ (18)
පුංචි (18, 25)
දුවලා (18, 20)
පුතාලා (18, 20)
නේද (18)
ඔව් (18)
ආදරයෙන් (19, 20)
සලකන්නේ (19)
කොහොම ද (19)
හිරිහැර (19, 26)
කරන්න (19, 22)
හොඳ (19)
නෑ (19)
කෑම (19, 23)
බීම (19)
දෙන්න (19, 22)
ඕනෑ (19)
හොඳයි (19, 20)
සලකන (20)
අත් (20)
ඔසවන්න (20)
සියලු දෙනා ම (20)
එසවූවා (20)
හැමෝම (20)
සලකනවා (20)
එහෙනම් (20)
දැන් (20)
කවියක් (20)
ගායනා (20)
කරමු (20)
කුරුලු (21)
ලෑල්ල (21, 22)
ගහ (21)
හොඳට (21)
සෙවණ (21)
තිබෙන (21)
තැනක (21)
ලෑල්ලක් (21)
කදිමට (21)
හදලා (21)
ඇත (21)
අපේ (21)
ගෙදර (21)
ලොකු (21)
මල්ලී (21)
එක (21)
දවසක (21)
පොඩි (21)
තව (21)
කුරුල්ලන්ට (21, 22)
අරන් (21, 23)
එතනට (21)
යනවා (21, 22)
හැම (21, 27)

දින (21, 27)
පසුවදාට (22)
බඩ (22)
පිරෙන්න (22)
දෙන්න (22)
පිරිසිදු (22)
හැන්දෑවට (22)
ලේනුන් (22)
සහ (22)
පොල්කිච්චන් (22)
ගිරවුන් (22)
දෙමලිච්චන් (22)
පිළිහුඩුවන් (22)
කපුටන් (22)
කෑමට (22)
එනවා (22, 27)
ලේන් (23)
හාමි (23)
එක (23)
පිම්මේ (23)
නගියි (23)
ගහට (23)
දෙමලිච්චෝ (23)
කඩිමුඩියේ (23)
පනිති (23)
වතුර (23)
බඳුන (23)
උඩට (23)
සතුන් (23)
වුණත් (23)
එකමුතුවට (23)
කන්නෙ (23)
අපූරුවට (23)
බලා (23)
ඉන්න (23)
අපට (23)
සතුටක් (23, 25)
දුනෙනවා (23)
හිතට (23)
අහස (24, 25)
උසයි (27)
හරි ම (24, 25, 26)
එහි (24)
තරුමල් (24)
පිපී (24, 28)
දිලෙයි (24)
පැනලා (24)
තරු (24, 25)
කඩන්න (24)
බැරි (24, 25)
තරමට (24, 25)
අත (24)
දික් (24)
කරලා (24)
ඉණිමඟ (24)
තියලා (24)
ගස් (24)
නැගලා (24)
හඳ (25)
පායා (25)
හැඩයි (25)
මුළු (25)
පරිසරය ම (25)
එළියයි (25)
හඳත් (25)
අපිට (25)
අල්ලගන්න (25)
සඳ (25)
අහසේ (25)
තිබුණට (25)
අල්ලන්නට (25)
වුණාට (25)
දුක (25)
දැනුණත් (25)
සිතට (25)
තරහක් (25)
කිසි (25)
දවසක (25)
සඳයි (25)
තරුයි (25)
දෙස (25)
බලමින් (25)
පුළුවනි (25)
ලබන්න (25)
හැමදාමත් (25)
ඔය (25)
විදිහට (25)
පායා (25)
දිලෙන්න (25)
සඳරුයි (26)
සමනලයයි (26)
සඳරු (26)
සමනලයෝ (26)
උදෑසනක් (26)
ඔබටත් (26)
පැණි (26)
බොන්නට (26)
උදයෙන් (26)
දැක්ක ම (26)
මට (26)
සතුටුයි (26)
නම් (26)
කිසිදා (26)
නොකරන (26)
දරුවෙකු (26)
බව (26)
දන්නවා (26)
ඔබ (26)
ගැන (26)
සැමදා (27, 28)
පිබිදෙනවා (27)
පාඩම් (27)
කරලා (27)
මෙතැනට (27)
හොඳින් (27)
ඉගෙන (27)
ගෙන (27)
යහපත් (27)
දරුවෙක් (27)
වෙන්නකො (27)
මතු දා (27)
කතා (27)
අප (27, 28)
හමු වී (27)
කියමු ද (27)
දෙදෙනා (27)
එක් වී (27)
ගස්වල (28)
තිබෙන (28)
අමුණා (28)
සාදන (28)
වැල් (28)
විලසින් (28)
එකමුතු වී (28)
අප (28)
සිටියොත් (28)
ලෝකය (28)
වෙයි (28)
හැමදාමත් (28)